**මහ කොළඹ ජලය හා අප ජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩ සටහනේ - 2 ව්‍යාපෘතිය - 2017**

---

මහ කොළඹ ජලය හා අප ජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩ සටහනේ - 2 ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 ජුනි 03 දින එළඹි අංක 3030 දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 වැඩ සටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩ සටහන් කාලය

---

මහ කොළඹ ජලය හා අප ජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩ සටහනේ - 2 ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට පළාත් පාලන, පළාත් සභා අමාත්‍යාංශය, වර්තමානයේ පළාත් සභා, පළාත් පාලන හා ක්‍රිඩා අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර කොළඹ මහ නගර සභාව හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ආයෝජන වැඩ සටහනේ අරමුණු වන්නේ, මහ කොළඹ ප්‍රදේශයේ ජල සැපයුම් හා අප ජලය සේවා වැඩිදියුණු කිරීම හා කළමනාකරණය කිරීම සහ මහ කොළඹ ප්‍රදේශයේ ජල සැපයුම් හා අපජලය සේවා පිළිබඳ කාර්යක්ෂමතාවය හා මූල්‍ය තිරසාරත්වය වර්ධනය කිරීමයි. ණය ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,230.60 කට සමාන එජඩො මිලියන 9.44 ක් වන අතර ඉන් රු.මිලියන 1,042.88 කට සමාන එජඩො මිලියන 8.00 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යායනය කරනු ලැබේ. රු.මිලියන 187.72 කට සමාන එජඩො මිලියන 1.44 ක ඉතිරි මුදල ශ්‍රී ලංකා රජය විසින් දායකවීමට අපේක්ෂා කෙරේ. කොළඹ මහ නගර සභාව විසින් ක්‍රියාත්මක කරන වැඩසටහනේ කාර්යයන් පිළිබඳ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ. වැඩ සටහන එහි කාර්යයන් 2014 සැප්තැම්බර් 23 දින ආරම්භ කරන ලද අතර 2018 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්

වැඩසටහනේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උපදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩසටහන් කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් වැඩසටහන විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, වැඩසටහනේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම් හා ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ වැඩසටහනේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 මතය**

**------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය

හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) වැඩසටහන විසින් පවත්වාගෙන යනු ලබන පොත්පත් හා වාර්තාවල විශේෂ ඩොලර් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂයන්, ආපසු ගැනීම් හා ප්‍රතිපූර්ණය කිරීම් සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳ තිබුණු බව,

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාස තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කිරීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබූ බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය සඳහා එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් 2017 වර්ෂය තුළ | | උපයෝජනය කළ අරමුදල් 2017 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසබැ | 8.00 | 1,042.88 | 200.00 | 0.43 | 65.34 | 0.62 | 92.70 |
| ශ්‍රීලංර | 1.44 | 187.72 | 80.00 | 0.10 | 15.94 | 0.15 | 23.87 |
| එකතුව | **9.44** | **1,230.60** | **280.00** | **0.53** | **81.28** | **0.77** | **116.57** |

ලැබී තිබුණු තොරතුරු අනුව, වැඩසටහනේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන්, 2017 වර්ෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් කරන ලද රු.මිලියන 280 ක වෙන්කිරීමෙන් සියයට 29.03 ක් නියෝජනය වන එකතුව රු.මිලියන 81.28 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළදී උපයෝජනය කර තිබුණි. වැඩසටහනේ මූල්‍ය සැලසුම් අනුව, 2017 දෙසැම්බර් 31 දිනට මුළු වෙන්කිරීමෙන් සියයට 77.75 ක් නියෝජනය වන එකතුව එජඩො මිලියන 7.34 ක් උපයෝජනය කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට සියයට 8.15 ක් නියෝජනය වන රු. මිලියන 116.57 කට සමාන එජඩො මිලියන 0.77 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

-------------------

ලැබී තිබුණු තොරතුරු අනුව, වැඩ සටහනේ ප්‍රධාන කාර්යයන් සමන්විත වන්නේ (අ) අනාගතයේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන මහ කොළඹ ජලය හා අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩසටහනේ ව්‍යාපෘතිය - 02 සඳහා විස්තරාත්මක සැලසුම් සම්පාදනය කිරීම සහ අපජල සේවා සඳහා ආයතනික ප්‍රතිසංස්කරණය සඳහා නිර්දේශයන් සැකසීම සඳහා සැලසුම් කිරීම, අධීක්ෂණය හා ආයතනික සංවර්ධන උපදේශනය (ආ) කිලෝමීටර් 125 ක් දුර අප ජල නාලිකා පිරිසිදු කිරීම තුළින් තත්ත්ව පරික්ෂාව සිදු කිරීම සහ අපජල පිළිබඳ සීසීටීවී (CCTV) සමීක්ෂණයන් සිදු කිරීම. නිර්මාණය කිරීම සුපරික්ෂණය සහ ආයතනික සංවර්ධනය සඳහා උපදේශක සහය ලබාදීම යටතේ කටයුතු අවසන් කර තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට වැඩ සටහනේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අපේක්ෂිත ඉලක්ක වලට පිටුපසින් පැවතුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 ජුනි 03 දින වැඩසටහනේ ගිවිසුම අත්සන් කර තිබුණද, 2016 අප්‍රේල් උපදේශකයින් පත් කර තිබුණු අතර 2016 ජුනි එම උපදේශකයින් වැඩ බිමෙහි සේවයේ යෙදී තිබුණි. පැකේජ දෙකෙහි ප්‍රමාදයට එය ප්‍රධාන හේතුවක් විය.

(ආ) තවද, ආයතනික සංවර්ධන විශේෂඥයකුගේ බඳවා ගැනීමේ ප්‍රමාදයක් හේතුවෙන්, කොළඹ මහා නගර සභාවේ ආයතනික සංවර්ධනය ජලාපවහන අංශය යටතේ කටයුතු 2017 දෙසැම්බර් 31 දිනට ආරම්භ කර නොතිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලැබී තිබුණු තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළදී කිලෝමීටර 125 ක් දුර අපජල නාලිකා පිරිසිදු කිරීම තුළින් තත්ත්ව පරික්ෂාව සිදුකිරීම සහ අපජලය පිළිබඳ සීසීටීවී (CCTV) සමීක්ෂණය සිදුකිරීම යටතේ මුල් විෂය පථයේ කටයුතු කිලෝමීටර් 108 කට අඩු කර තිබුණි. වෙනත් ව්‍යාපෘති මඟින් අවසන් කළ වැඩ සමඟ සීසීටීවී (CCTV) අපජල නාලිකා යටතේ කටයුතු ආවරණයවීම, විශේෂිත වූ උපකරණවල අවශ්‍යතාවය සහ පිරිවැය වැඩිවීම යනාදී ගැටළු කිහිපයක් සලකමින් නව විෂය පථයේ වැඩ තීරණය කළ බව ව්‍යාපෘති අධ්‍යක්ෂක පැහැදිළි කර තිබුණි.

(ආ) අපජල නාලිකා සඳහා සීසීටීවී විමර්ශනය ඇතුළුව අපජල නාලිකා පිරිසිදු කිරීම සහ තත්ත්ව පරික්ෂාව සිදුකිරීම සහ අපජල නාලිකා සඳහා වත්කම් කළමනාකරණ දත්ත පද්ධතිය පිළිබඳ කොන්ත්‍රාත්තුවේ ලංසු කැඳවීම 2017 ජුලි 27 දින අවසන් කර තිබුණි. කෙසේවෙතත්, ලංසු කැඳවුම් ලියවිලිවල ලංසු ඉදිරිපත් කිරීම සඳහා යොදා ගත යුතු භාෂාව විශේෂයෙන් සඳහන් කර නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස, එම ලංසු විවිධ භාෂාවලින් ඉදිරිපත් කර තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට ලංසු ලියවිලි ඇගයීමේ ක්‍රියාවලිය කෙරෙමින් පැවතුණි.